www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බටහිර බෙංගාල ස්ටැලින්වාදීහු හිටපු ඉන්දුනීසියානු ආඥාදායකයාට ඈඳුනු සමාගමක් සමග ගනුදෙනු අරඹති

## West Bengal Stalinists sign deal with firm tied to ex-Indonesian dictator

**අජේ ප්‍රකාශ් විසිනි**
**2006 අගෝස්තු 25**

පසු ගිය මාසයේ දී බටහිර බෙංගාලයේ ස්ටැලින්වාදීන්ගේ මූලිකත්වයෙන් යුත් වාමාංශික පෙරමුනු ආන්ඩුව සලිම් ග්‍රෑප් නම් වූ හිටපු ඉන්දුනීසියානු ආඥාදායක ජෙනරල් සුහර්තෝ සමග කිට්ටු සබඳකම් ඇති ඉන්දුනීසියානු දැවැන්ත ව්‍යාපාරය සමග ඉන්දියාවේ විශාලතම සෘජු විදේශ ආයෝජන ගනුදෙනුව අත්සන් කලේ ය.

සලිම් ග්‍රෑප්හි නිර්මාතෘ වනුයේ ලියෙම් සියෝ ලියොන්ග්. 1940 දී පටන්ගත් මිතුදම උඩ, සුහර්තෝ විසින් ප්‍රදානය කරන ලද වරප්‍රසාද තුලින් සිය වාසනාව ලඟා කර ගත් ලියෙම්, ඉන්දුනීසියාවේ සිටින ධනවත්ම පුද්ගලයා ලෙසට වාර්තා වේ.

1965 සහ 1966 අතරතුර දී මිලියනයකට පමන මරු කැඳවමින් ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයන් හා අනුගාමිකයන් වෙත මුදාහල ලේවැකි විරේකය ට සුහර්තෝ වගකිව යුතු විය. නමුත්, එයින් ඉන්දියාවේ-මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඅයිඑම්) බටහිර බෙංගාල මහ ඇමතිධුර බුද්ධදේව් භට්ටාචාර්ජී නොනැවැත්විය හැකි වූ අතර ගනුදෙනුවට අනුබල දෙමින් සහ විවේචන ඉවතට හලමින්, "ඇයි අපි අතීතය අවුස්සන්නේ, ඔවුහු (සලීම් ග්‍රෑප්) චීනයේත් ආයෝජන කරල තියෙනවා. අපේ ස්ථාවරය පැහැදිලියි. රජයේ සංවර්ධනය සඳහා අපට ප්‍රාග්ධනය අවශ්‍යයයි. අප ආයෝජකයාගේ චරිතය සම්බන්ධව සැලකිලිමත් විය යුතු නෑ. මට නම් ප්‍රාග්ධනයට වර්නයක් නෑ."

මහ ඇමති ලෙස පත්වුන දා සිට, භට්ටාචාර්ජී ස්ථිරව ම ප්‍රකාශ කලේ ඉන්දියාව අනුගමනය කල යුත්තේ චීන මොඩලය බවයි. ලෝක වෙලඳපොල සඳහා ලාභ ශ්‍රම නිෂ්පාදනයටත්, ව්‍යාපාර ක්‍රමවේදයන්ටත්, පර්යේෂන පහසුකම් සංවර්ධන කිරීමටත් බලාපොරොත්තුවන ඉන්දියානු සහ අන්තර්ජාතික සමාගම් සඳහා ඉන්දියාව කාන්දමක් විය යුතු බව ඔහුගේ මතය විය.

භට්ටාචාර්ජී ඉදිරියේ, ජුලි 31වන දා, සෘජු විදේශ ආයෝජන සම්මුතිය, සලිම් ග්‍රෑප් පාර්ශ්වයෙන් එහි විධායක අධ්‍යක්ෂ බෙනී සන්තෝසෝ, බටහිර බංගාල ව්‍යාපාර ලේකම් සබ්‍යාසචි සෙන් හා බටහිර බෙංගාල ව්‍යාපාර සංවර්ධන සංස්ථාවේ කලමනාකාර අධ්‍යක්ෂ දෙබසිස් සොම් අතරේ අත්සන් කෙරින. එම අවස්ථාවේ දී, බටහිර බෙංගාල මහ ඇමති පැවසුවේ "බෙංගාලයේ ජනතාව අප ක්‍රියාත්මක වනතුරු බලා සිටිනවා.... රජය සඳහා ඔවුන් වරම ලබා දුන්නේ කෘෂිකර්මය හා ව්‍යාපාර අතරේ තුලනයක් ඇතිකිරීමට සහ රජය ඉදිරියට ගෙන යන්නටයි."

මෙම සෘජු විදේශ ආයෝජන ගනුදෙනුව, රුපියල් බිලියන 200ක් (ඇමරිකානු ඩොලර් බිලියන 4.2) වටිනා අතර, අධිවේගී මාර්ග හා පාලම් සම්පාදනයටත්, හල්දියාහි අක්කර 12,500 පුරා විහිදුනු (වර්ග සැතපුම් 20ක,වර්ග කි.මී.50) විවිධ නිෂ්පාදන සහිත ලාභ ශ්‍රමය විකුනන විශේෂ ආර්ථික කලාප සඳහාත්, නැගෙනහිර මිඩ්නාපූර්හි අක්කර 10,000 එවැනිම ආනයනිත නිෂ්පාදන කර්මාන්ත, සහ තවත් අක්කර 3000ක සෞඛ්‍ය හා දැනුම් නගර හෝ සංකීර්නයන් මෙම දැවැන්ත වැඩ සටහනට ඇතුලත් වේ. සියල්ල ම සඳහා අක්කර 40,000ක ඉඩම් අවශ්‍ය වනු ඇත.

භාරතීය ජනතා පක්ෂය (බීජේපී) විසින් නායකත්වය සපයන ලද, පසු ගිය සමූහ (යූනියන්) ආන්ඩුව විසින් වසර 2000 දී, මුල්වරට විශේෂ ආර්ථික කලාප සංකල්පය හඳුන්වාදෙන ලදී. එතැන් පටන් එවැනි 42ක් දැනට මධ්‍යම රජය මගින් අනුමත කර ඇත. ඊට අමතරව, දැනට පවතින විශේෂ අපනයන ප්‍රවර්ධන කලාප විශේෂ ආර්ථික කලාප ලෙස වෙනස් කර ඇත.

තමන්ගේම වූ ජල සහ විදුලි සැපයීමේ ක්‍රම සහිත ස්වයංපූර්න ප්‍රදේශයක් ලෙසට, සාමාන්‍යයෙන් පුද්ගලික අංශය සමග එකතු වීමෙන්, ප්‍රාන්ත ආන්ඩු විසින් මෙම විශේෂ ආර්ථික කලාප පිහිටුවයි. බදු, සේවක ප්‍රමිතීන් හා අනෙකුත් රෙගුලාසි බල නොපාන බැවින් මෙම කලාප ධනපතියන්ට බොහෝ වටිනාකමක් ඇත.

*ඉන්ඩියා ටුඩෙදර්* සඟරාවට අනුව, "ආයෝජකයින් මෙම කලාපවලට කැමති කරවා ගැනීමට, මධ්‍යම ආන්ඩුව මගින් බොහෝ මූල්‍යමය දිරිගැන්වීම් සහ සහන පිරිනමා ඇත. උදාහරනයකට අනුව, වෙලඳ මෙහෙයුම්, තීරු බදු හා අය ක්‍රම ගැන සැලකීමේ දී, මෙම කලාප සලකනු ලබන්නේ විදේශ භූමි ප්‍රදේශ ලෙස ය. එම ඒකක (සියයට සියයක්ම අපනයන සඳහා යොමු වූ) මෙහෙයුම්වල දී සම්පූර්න නම්‍යතාවයෙන් ද යුක්තය. ඒවා ඍජු හා ඍජු නොවන බදුවලින් නිදහස් ය. ආනයන හා අපනයන තීරුබදු, එක්සයිස්බදු, මධ්‍යම හෝ ප්‍රාන්ත අලෙවි බදු සහ සේවා බදු කිසිවක් නැත. ප්‍රාග්ධන භාන්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය සඳහා මෙම ඒකකවලට බලපත්‍ර අවශ්‍ය නැත. කලාප තුල සියයට සියයක්ම ඍජු විදේශ ආයෝජනවලට අවසර ලැබේ. අපනයන ලාභ පෙරලා සියරට යැවීමට ද අවසර ඇත."

රාජ්‍ය ආයතන වෙතින් කිසිදු නීතිමය සීමා කිරීම් හෝ බලපෑම් වලින් තොර වූ ලාභ ශ්‍රමය ආයෝජකයන් හට විශේෂ ආර්ථික කලාප මගින් පිරිනමයි. සාමාන්‍යයෙන් අතිකාල දීමනා නිවාඩු දින දීමනා හෝ විශ්‍රාමික වාසි කිසිවක් නොමැතිව අඩු වැටුප් සඳහා දිනකට පැය 10-12 ක් සිය සේවය සැපයීමට, කම්කරු හෝ වෘත්තීමය සේවකයන් වුවද එක සමාන සේවා කොන්දේසිවලට මුහුන දීමට සිදුවේ. විදේශ ප්‍රාග්ධන සහ ඉන්දියානු මහා ව්‍යාපාරවල කැමැත්ත දිනාගැනීමට බටහිර බෙංගාලයේදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) විසින් හඳුන්වාදෙන තත්වයන් මෙපරිදි වේ.

සලීම්ගේ ඉඩම් ඉල්ලීම සපුරාලීමට දුප්පත් ගැමියන්ගේ ඉඩම්වල භුක්තිය පැහැරගැනීම සහ වන්දි ගෙවීමේ වඳකම සම්බන්ධව එරෙහි වූ වාමාංශික පෙරමුනේ අනෙක් හවුල්කරුවන් වන ෆෝවර්ඩ් බ්ලොක්, විප්ලවකාරී සමාජවාදී පක්ෂය හා ඉන්දීය විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂයේ නායකයින් සහ සමහර සීපීඅයි(එම්) හි ආධාරකරුවන්, මෙම ගනු දෙනුව අත්සන් කරන්නට දින දෙකකට පෙරාතුව, භට්ටාචාර්ජි විසින් හමුවන ලදි.

ප්‍රාන්තයේ ප්‍රධාන විරුද්ධ පක්ෂයේ නායිකාව වන දක්ෂිනාංශික ත්‍රිනමුල් කොන්ග්‍රස්හි මමතා බැනර්ජි ද සලිම් ගනුදෙනුවට විරුද්ධ කන්ඩායම් සමග හවුල් වූවා ය. "විදේශිකයින්" වෙනුවෙන් විශාල ඉඩම් ප්‍රමානයක භුක්තිය පැහැරගැනීම ඇයගේ දෝෂදර්ශනයට ලක් වූ අතර, බෙන්තෝසෝගේ පැමිනීමට විරුද්ධව විරෝධතාවයක් සංවිධානය කිරීමට අසාර්ථක උත්සාහයක යෙදුනා ය.

සලිම් ගනුදෙනුව සම්බන්ධව වාමාංශික පෙරමුන තුල ඇති වූ විරුද්ධතාවය සුලු අප්‍රසන්නතාවයකට වඩා වැඩි යමක් නොවීය. එම පෙරමුනේ සභාපති වන (සීපීඅයි-එම් හි ප්‍රාන්ත කමිටු ලේකම්) බිමන් බෝස් විස්තර කල ලෙසට, වන්දි ප්‍රදානය ගැන නොසන්සුන්කමක් පැවතුනත්, වාමාංශික පෙරමුනු නායකයෝ පෞද්ගලික ආයෝජකයන් සමග ගනුදෙනුවකට එකඟ වුන අතර සලිම් ගෲප්වෙත පාවිච්චි කෙරෙන ඉඩම් පැවරීමට අනුමත කලේ ය.

ඔහුගේ විවේචකයින්ට පිලිතුරු සැපයීමට උත්සාහයක් දරමින්, ප්‍රාන්ත කර්මාන්ත ඇමති නිරුපම් සෙන් පැවසුවේ, ඉහල ඵලදායිතාවක් ඇති හා භෝග විවිධාංගි ඉඩම් "හැකිතාක් දුරට" ඉතිරි කොට පුරන් වූ සහ පහල මට්ටමේ කෘෂිකාර්මික ඉඩම් පාවිච්චි කිරීමට ව්‍යාපෘති කලමනාකරුවන් උත්සාහ කරනු ඇතැයි සලිම් ගෲප් හා බටහිර බෙංගාල රජය අත්සන් කල අවබෝධතා ගිවිසුමෙහි පැහැදිලිව දක්වා ඇති බව යි. පවුලකට පොලිය මත යැපෙන්නට හැකි ඉහල තලයක වන්දි මුදලක් හා ඉවත් කරන ගොවීන්ට විකල්ප ජීවනෝපායක් සෙන්ගේ පොරොන්දුවලට ඇතුලත් ය. ලියාපදිංචි අඳගොවීනට (වර්ගර්ඩාස්) ඔවුන් වගා කරන ඉඩම්හි වටිනාකමෙන් සියයට 25ක් දීමට ආන්ඩුව පොරොන්දු වී තිබේ. මෙය ඉඩම් හිමියන්ට ගෙවන ලද වන්දි මුදලට වඩා වැඩි මුදලකි.

වාමාංශික පෙරමුන තුල නොසන්සුන්තාවයක් පැන නැගීමට හේතු වූයේ ගැමියන් තම ඉඩම් සහ ජීවනෝපායන් නැති වීම සම්බන්ධව කෝප වී ඇති නිසාත් වන්දි මුදල් ඉල්ලුම හා අනාගත රැකියා සම්බන්ධව පවතින සැකසහිත බව නිසාත් ය. තමන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සීපීඅයි-(එම්) පෙනී නොසිටින බවට වැඩෙන පිලිගැනීම, පසු ගිය වසන්තයේ දී පැවැත්වූ මැතිවරන ප්‍රතිඵලවලින් පැහැදිලි විය. එක් විශ්ලේෂනයකට අනුව, මධ්‍යම සහ ඉහල පන්තිවල ඡන්ද ප්‍රතිශතය 18%කින් වැඩි වන අතරේ දී, ග්‍රාමීය ඡන්ද 10%න් සීපීඅයි(එම්) හට නැතිවිනි. රාජ්‍යය පුරාම වාමාංශික පෙරමුන සිය ආසන සමාන කර ගත්තත්, සලිම් අතර ගනුදෙනුවෙන් පීඩාවට පත් වන විශාලිත කොල්කටා කලාපයේ ප්‍රදේශවල බොහෝ ආසන තමන්ට අහිමිව ගියේ ය.

*ටයිම්ස් ඔෆ් ඉන්ඩියා* සටහන් කරන ලෙසට, " ව්‍යාපෘති සඳහා සිය ඉඩම් බලහත්කාරයෙන් අහිමි කෙරුනු මිනිසුන්ට වන්දි ගෙවීමේ දී ඉන්දියානු රාජ්‍යයට ඇත්තේ දුර්වල වාර්තාවකි." කොල්කටාවේ නාගරිකයක් වන සෝල්ට් ලේක් සිටිහි රාජරාත් නව නගරය නිර්මානය කිරීමේ දී සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවලදී, දසදහසක් වන දුප්පත් ගොවියන්ට වන්දි ගෙව්වේ අක්කරයකට රුපියල් 45000ක් (ඇ.ඩො.1,000) ලෙසිනි. සංවර්ධනය කිරීමෙන් පසු ඉඩම් සමාගම් විසින් අක්කරය රු. ලක්ෂ 20කට (ඇ.ඩො. 43,000) කට අලෙවි කෙරිනි.

බට්ටාචාර්ජි තමන්ගේම මුල පිරීමකට අනුව කටයුතු කරනවා නොවේ. පසු ගිය වසරේදී සලිම් ගෲප් සමග සාකච්ඡා ඇරඹූ අවස්ථාවේ සිට සීපීඅයි එම් හි දේශපාලන බල මන්ඩලයේ ප්‍රකාශ් කරාත්, සීතා රාම්

යෙචූරි සහ ජෝති බාසු සිය ස්ටැලින්වාදී නායකයාට සම්පූර්න සහයෝගය දුන්නා පමනක් නොව සිය නායකයාගේ ප්‍රතිපත්තිවලට එරෙහිව යන්නන්ට විනයානුකූල ක්‍රියාමාර්ගවලට මුහුන දෙන්නට වන බවට පාඨකයන්ට අවවාද කලෝ ය.

2001 මහ ඇමති ධුරය ලද දා සිට, බට්ටාචාර්ජී කම්කරු ප්‍රචන්ඩකාරිත්වයේ මධ්‍යස්ථානයක් ලෙසට බටහිර බෙංගාලයට ලැබී ඇති මතය පලවාහැරීමට සිය මෙහෙයුම දියත් කල අතර එය ආයෝජනයට ආරක්ෂාකාරී දෙව්ලොවක් ලෙසට ඉහල ප්‍රචාරයක් දෙන ලදි.

පසු ගිය සැප්තැම්බරයේදී, වාමාංශික පෙරමුනෙහි සහාය ලද එක් දින මහා වැඩ වර්ජනය, කොල්කටාහි පරිගනක තාක්ෂන හා ඒ ආශ්‍රිත ව්‍යාපාර ප්‍රවර්ධන සමාගම්හි මෙහෙයුම් කඩාකප්පල් කල විට, සුදුමැලි වූ භට්ටාචාර්ජී, එවැනි කඩාකප්පල්කාරී ක්‍රියාවන් නැවත සිදු නොවන බවට පොරොන්දු විය. "ඔවුහු පරිගනක තාක්ෂනය නොහඳුනති. ඒක හන මෝලක්වගේ නෙමෙයි. ඒක 24/7 (දින 7යි පැය 24යි) වන අතර වර්ජන සඳහා ඉඩක් නොතිබිය යුතුයි. මම මේ වැරදි වැටහීම නිවැරදි කරන්නට උත්සාහ කරනවා. අයිබීඑම්, වයිප්‍රෝ, කොග්නිසන්ට්, පීඩබ්ලිව්සී සහ අනෙකුත් විශාල පරිගනක තාක්ෂන සමාගම්වලට මම සහතික වෙන්නට බලාපොරොත්තු වෙනවා, ඊලඟ වතාවේ දී සම්පූර්න සාමය පවතින බවට" ඔහු පැවසුවේය. *ඉන්ඩියා ටුඩේ* පුවත්පතට අනුව අත්අඩංගුවට ගැනීම සඳහා පිකට් කලවුන්ගේ නම් ලබා දෙන ලෙස පරිගනක තාක්ෂන සමාගම්වලින් විමසා ඇත.

ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් ගනකාධිකාරින්ගේ සහ බ්‍රිතාන්‍ය රාජ්‍යයේ අන්තර්ජාතික සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, වාමාංශික පෙරමුනු රජයසේවා ඒකක ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙලෙහි පලමු අදියර මෑතක දී නිම කලේ ය. එම වැඩ පිලිවෙල තුලින් රාජ්‍ය ආයතන 10ක් සම්පූර්නයෙන් වසා දැමීමටත්, 15ක් ප්‍රතිසංස්කරනයටත් එක් ආයතනයක් වන කොල්කටාහි ග්‍රේට් ඊස්ටර්න් හෝටලය, පුද්ගලිකරනයටත් තෝරාගෙන ඇත. පසු ගිය වසරේ දී, 422ක් වූ එම හෝටලයේ කාර්ය මන්ඩලය රජය විසින් නෙරපා හැරිය අතර රුපියල් මිලියන 520 (ඇ.ඩො. මිලියන 11.4) කට එය භාරත් හෝටල් ව්‍යාපාරයට විකුනා දමන ලදි.

දෙවන අදියරේදී, රාජ්‍ය විදුලිබල මන්ඩලය සහ රාජ්‍ය ප්‍රවාහන සමාගම් ද ඇතුලත්ව රාජ්‍ය සේවා ඒකක 29ක් ප්‍රතිව්‍යුහගතකරනය සඳහා හඳුනාගෙන ඇත. 80,000ක පමන සේවක සංඛ්‍යාවකට බලපෑම් එල්ලවේ. කොල්කටා සිට කිලෝ මීටර් කිහිපයක දුරින් පිහිටි කුල්පි හි, ඉන්දියාවේ මුල්ම පුද්ගලික වරාය සහ විශේෂ ආර්ථික කලාපයක් (එස්ඊසෙඩ්) ගොඩ නැගීමට පීඇන්ඩ්ඕ නාවික සමාගම සමග ඇ.ඩො. මිලියන 235ක කොන්ත්‍රාත්තුවක් රජය විසින් අත්සන් කර ඇත.

ආයෝජකයන් කැඳවා ගැනීමට බටහිර බෙංගාල රජයේ සූදානම බුෂ් පරිපාලනයේ අවධානය දිනාගෙන තිබේ. මෑතක දී කොල්කටාවට පැමිනි එක් දින චාරිකාව තුලදී, දකුනු හා මධ්‍යම ආසියානු කටයුතු පිලිබඳ එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් රිචඩ් බව්චර්, "මම චීනයේ බොහෝ කලක් වැඩ කර තියෙනවා. මීයන් අල්ලන තාක් දුරට බලලා සුදුද කලුද යන්න ගැටලුවක් නෙමෙයි යනුවෙන් කියමනක් ඩෙන් ෂියාඕපින් ට තිබුනා. අපි ප්‍රායෝගික යමක් අත් කරගැනීමට උනන්දු වන මිනිසුන් සමග වැඩ කරනවා." යනුවෙන් ප්‍රකාශ කලේ ය.

බටහිර බෙංගාල වාමාංශික පෙරමුනු රජය සේ ම, කේරල ප්‍රාන්තයට අලුතෙන් තේරී පත් වූ වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුනු අමාත්‍යංශය ද නව-ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරන කරගෙන යයි. පසු ගිය මාසයේ දී, කේරලයේ සීපීඅයි(එම්) හි මහ ඇමති වී.එස්. අචුතානන්දන්, තම රජය පරිගනක තාක්ෂන, සංචාරක හා කෘෂිකාර්මික යන සියලු මූලික අංශ සඳහා පුද්ගලික ආයෝජන සඳහා ආරාධනා කරන බව පැවසූ අතර ඉන්දීය ධනපති පන්තියේ නව ලිබරල් වැඩසටහනෙහි උග්‍ර අද්වකාත්වරයෙකු වන ජාතික සැලසුම් කොමිසමෙහි උප සභාපතිවන මොන්ටෙක් සිං අලුවාලියා මුනගැසුනේ ය. පරිගනක තාක්ෂන හා සංචාරක ක්ෂේත්‍රවල හර්තාල් (දේශපාලන විරෝධතා වර්ජන) තහනම් කිරීමට රජ්‍යයේ දේශපාලන ව්‍යාපාර අතර "දේශපාලන ඒකමතිකභාවය" කට පැමිනීමට තමන්ට ඇති අවශ්‍යතාවය ස්ටැලින්වාදීන්ගේ නායකත්වයෙන් සැදුම්ලත් කේරල ආන්ඩුව ප්‍රකාශ කලේ ය.

ඉන්දීය ධනපති පන්තියේ සේවකයෙක් හා දේශපාලන ආධාරකරුවෙක් ලෙස ක්‍රියා කරන අතරතුරේදී කම්කරු පන්තිය සහ ග්‍රාමීය දුගීන් ගේ ආරක්ෂකයෙක් ලෙස සීපීඅයි(එම්) සහ වාමාංශික පෙරමුන පෙනී සිටිති.

වැඩවසම් ප්‍රතික්‍රියාවන්ට සහ අධිරාජ්‍ය ගැති ධනපතිපන්තියට විරුද්ධව ජාතික ධනපති පන්තියේ " අධිරාජ්‍ය විරෝධී" කොටස්වලට සහාය වීම සුදුසු යයි පවසමින්, සීපීඅයි(එම්) හා එහි වාමාංශික පෙරමුනු සහායක, සීපීඅයි, නිදහසින් පසු මුල් දශක හතරේදී, ඉන්දීය ජාතික සංවර්ධන වැඩපිලිවෙලට සිය සහාය දීම යුක්තිසහගත කලේ ය. දැන්, ඊටත් වඩා දරුනු දුරාචාරයක මාක්ස්වාදය යොදවමින්, චීනය තම මොඩලය බව පෙන්වමින්, ස්ටැලින්වාදීහු අන්තර්ජාතික ප්‍රාග්ධනය කැඳවා ගැනීමේ ලාභ ශ්‍රම කාන්දමක් බවට බටහිර බෙංගාලය පත් විය යුතු බවට පවසති. "මම උත්සාහ කරන්නේ වර්තමාන යථාර්ථය පිලිගෙන වැඩ කිරීමටයි.... අපප්‍රායෝගික බැවින්, මුලු ලෝකය ම

ධනවාදය වැලඳගෙන ඇති මොහොතේදී, ධනපතියෙක් වීම ඥානවන්ත බව අප දන්නවා" යි භට්ටාචාර්ජි පැවසුවේ ය.

මූලු ඉන්දීය තලයේදී ම, බදු කපාහැරීම්, පුද්ගලිකරනය, රෙගුලාසිහරනය, කම්කරු අයිතිවාසිකම් හා ගොවිපොල සහන මුලිනුපුටා දැමීම සහ ආදායම් සහන කපා දැමීම් තුලින් යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මුදල් ලබාදෙන නව ලිබරල් වැඩ පිලිවෙල පෙරට දැමීම සඳහා, වාමාංශික පෙරමුන, ධනපතියන්ට සහාය වීමේ තීරනාත්මක චරිතය රඟපෑමේ යෙදේ. ගැඹුරුවන ආර්ථික අනාරක්ෂිත භාවය සහ සමාජ අසමානතාව පිලිබඳ වැඩෙන මහජනතා විරෝධය වෘත්තීය සමිති හා පාර්ලිමේන්තු විරෝධතාවලට සීමා කරලන අතරතුරේදී, 60කට වඩා වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින වාමාංශික පෙරමුන, සුලුතර කොන්ග්‍රස් පක්ෂය විසින් නායකත්වය දෙන එක්සත් ප්‍රගති සන්ධාන සභාගය බලයේ තබා ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද සපයයි.

© www.wsws.org